සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

විශාඛා විද්‍යාලය කොළඹ - 5, විශාඛා විද්‍යාලය කොළඹ - 5, විශාඛා විද්‍යාලය කොළඹ - 5, විශාඛා විද්‍යාලය කොළඹ
Visakha Vidyalaya Colombo – 5, Visakha Vidyalaya Colombo – 5, Visakha Vidyalaya Colombo – 5, Visak
විශාඛා විද්‍යාලය කොළඹ - 5, විශාඛා විද්‍යාලය කොළඹ - 5, විශාඛා විද්‍යාලය කොළඹ - 5, විශාඛා විද්‍යාලය කොළඹ
Visakha Vidyalaya Colombo – 5, Visakha Vidyalaya Colombo – 5, Visakha Vidyalaya Colombo – 5, Visak

**විශාඛා විද්‍යාලය - කොළඹ 05**

**Visakha Vidyalaya, Colombo 05**

පළමුවන වාර පරීක්ෂණය 2023 (2023 ජූලි)

# First Term Test 2023 (July 2023)


| ගණිතය<br>**Mathematics** | 6 ශ්‍රේණිය<br>Grade 6 | *පැය දෙකයි මිනිත්තු 30 යි*<br>*Two hours 30 minitues* |
|---|---|---|

නම / අංකය : ..........................................................................................

1 කොටස

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.

**1.** පහත රූපයෙන් $\frac{3}{8}$ ක් අඳුරු කරන්න.



2. සංඛ්‍යාවක් 100න් බෙදූවිට ලබ්ධිය 26 ද ශේෂය 3 ද විය. එම සංඛ්‍යාව කීයද?


3. 1, 4, 8,7 යන ඉලක්කම් හතරම එක් වරක් පමණක් යොදා ගනිමින් ලිවිය හැකි

(i) කුඩාම ඔත්තේ සංඛ්‍යාව ....................

(ii) විශාලම ඉරට්ටේ සංඛ්‍යාව ....................

4. 78154 ගණක රාමුවකින් නිරූපණය කරන්න.

5. පහත සංඛ්‍යා රේඛාව මත ලකුණු කර ඇති නිඛිල සියල්ල ලියන්න.




*දෙවැනි පිටුව බලන්න]*


6. සිලින්ඩරයට ඇති වෘත්තාකාර මුහුණත් ගණන කීය ද?

7. කමනි පොත්හලකින් පිටු 80 තනිරූල් පොත් 6ක් මිල දී ගෙන වෙළෙන්දාට රු. 1000 ක් දුන් විට ඇයට ඉතිරි ලෙස රු. 250 ක් ලැබුණි. පොතක මිල සොයන්න.

8. රූපසටහන අනුව,

(i) වෘත්ත දෙකම මත ඇති ලක්ෂ්‍යයක් නම් කරන්න.

(ii) වෘත්ත දෙකම තුළ ඇති ලක්ෂ්‍යයක් නම් කරන්න.




9. මාතරින් පෙ.ව. 11.30 ට පිටත් වූ බස් රථයක් පැය 3 කට පසු කොළඹට ලඟා විය. කොළඹට ලඟා වන විට වේලාව සම්මත ආකාරයට දක්වන්න.

10. (i) උතුරු දිශාව සහ වයඹ දිශාව අතර දක්ෂිණාවර්තව සෑදෙන කෝණය රූප සටහනකින් නිරූපණය කරන්න.

(ii) එම කෝණය කුමන වර්ගයට අයත් ද?

11. පහත අසමානතා කියවන අයුරු වචනයෙන් ලියන්න.

(i) $-7 < -5$ ..............................................................................................

(ii) $0 > -2$ ..............................................................................................

12. වලනිගේ උපන්දිනය 2012 මාර්තු පස්වන දා ය.


(i) වලනිගේ උපන්දිනය සම්මත ආකාරයටලියන්න.

(ii) ඇයගේ සොහොයුරිය ඇයට වඩා අවුරුදු 3කින් වැඩිමහල් නම් සොහොයුරියගේ උපන් වර්ෂය සොයන්න.

13. (i) තලයක තිරස් බව දැනගැනීමට භාවිතා කරන උපකරණය ලියන්න.

(ii) ඝනකයක් තිරස්ව මේසයක් මත තැබූ විට එහි සිරස්ව පිහිටන දාර ගණන කොපමණ ද?

14. පන්සලේ සිට පාසල පිහිටා ඇති දිශාව කුමක් ද?




15. '3648056173' මෙම සංඛ්‍යාවේ මිලියන කලාපයට අයත් ඉලක්කම් කාණ්ඩය ලියන්න.


16. නිශානි පළමු වාර පරීක්ෂණයේ ගණිතය විෂයයට ලබාගත් ලකුණු ආසන්න 10කට වටයූ විට 80ක් විය. ඇයගේ ලකුණු සඳහා විය හැකි

(i) උපරිම අගය ..................................................

(ii) අවම අගය ..................................................

17. 84521 සංඛ්‍යාවේ 4න් නිරූපණය වන අගය 2න් නිරූපණය වන අගය මෙන් කී ගුණයක් ද?

18. දී ඇති භාජනයේ ජලය 50ml ඇත. භාජනය සම්පූර්ණයෙන් පිරවීමට තවත් කොපමණ ජල ප්‍රමාණයක් අවශ්‍ය ද?




19. හිස්කොටුව තුළ ලිවිය යුතු සංඛ්‍යා සොයන්න.

(i) ☐ × 100 = 7800

(ii) 35000 ÷ ☐ = 35

20. සීනි 1kg ක මිල රු. 220කි. සීනි 750g ක මිල සොයන්න.

* *

## II කොටස

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

**1.** (*a*) 75968432 යන සංඛ්‍යාවේ 6 පිහිටි ස්ථානයට අදාළ,

(i) ස්ථානීය අගය කීය ද? (ලකුණු 1)

(ii) 6න් නිරූපිත අගය කීය ද? (ලකුණු 1)

(*b*) (i) 45126578 යන සංඛ්‍යාව සම්මත ආකාරයෙන් දක්වන්න. (ලකුණු 1)

(ii) ඉහත සංඛ්‍යාවේ සංඛ්‍යානාමය අකුරෙන් ලියන්න. (ලකුණු 1)

(iii) තුන්බිලියන අටදහස් පහ ඉලක්කමෙන් ලියන්න. (ලකුණු 1)

(*c*) 1, 3, 5, 4, 2 යන ඉලක්කම්වලින් එක් ඉලක්කමක් එක් වරක් පමණක් යොදා ගනිමින්,

(i) ලිවිය හැකි විශාලතම සංඛ්‍යාව ලියන්න. (ලකුණු 1)

(ii) ලිවිය හැකි කුඩාම සංඛ්‍යාව ලියන්න. (ලකුණු 1)

(iii) එම සංඛ්‍යා දෙකෙහි වෙනස සොයා ලැබෙන සංඛ්‍යාවෙහි සංඛ්‍යා නාමය ද ලියන්න. (ලකුණු 3)

**2.** (*a*) සුළු කරන්න.

(i)

```
     75
   201□
+   □89
-------
  □7□6
=======
```

(ලකුණු 2)

(ii)

```
   4005
 − 2807
 ------

 ======
```

(ලකුණු 2)

(*b*) පුස්තකාලයක පොත් රාක්ක 18 ක් තිබේ. එක් රාක්කයක පොත් 350 ක් තිබේ. එයින් හරි අඩක් කියවීම සඳහා සාමාජිකයින් වෙත ලබා දෙන ලදී. ඉතිරි වූ පොත් සංඛ්‍යාවෙන් 700 ක් භාවිතයට නුසුදුසු නිසා ඉවත් කරන ලදී.

(i) පුස්තකාලයේ තිබූ මුළු පොත් සංඛ්‍යාව කොපමණ ද? (ලකුණු 2)

(ii) පුස්තකාල සාමාජිකයන් වෙත ලබා දුන් පොත් සංඛ්‍යාව කොපමණ ද? (ලකුණු 2)

(iii) භාවිතයට නුසුදුසු පොත් ඉවත් කිරීමෙන් පසු ඉතිරි වූ පොත් සංඛ්‍යාව සොයන්න. (ලකුණු 2)

**3.** (i) (−5) සිට (+5) තෙක් ඇති සංඛ්‍යා රේඛාවක් අඳින්න. (ලකුණු 1)

(ii) $P = +3$ සහ $Q = -2$ සංඛ්‍යා රේඛාව මත ලකුණු කරන්න. (ලකුණු 2)

(iii) $P$ සහ $Q$ අතර ඇති සියලු නිඛිල ලියන්න. (ලකුණු 2)

(iv) අසමානතා ලකුණු යොදමින් පහත හිස්තැන් සම්පූර්ණ කරන්න.

(*a*) $-4$ .......... 3

(*b*) 0 .......... $-2$


(*c*) $-7$ .......... $-1$

(ලකුණු3)

(v) −1, 0, −4, −2, 2, 4 යන සංඛ්‍යා අවරෝහණ පටිපාටියට ලියන්න. (ලකුණු 2)

පස්වැනි පිටුව බලන්න]


4\. (*a*) පාසලේ ක්‍රීඩා උත්සවයේ සරඹ සංදර්ශනය සඳහා සිසුන් පෙළ ගස්වා සිටි ආකාරය පහතින් දැක්වේ. සියලු දෙනා උතුරු දිශාවට මුහුණලා සිටගෙන සිටියි. පහත දී ඇති තොරතුරු අනුව අදාළ සිසුන් සිටින තැන් රූප සටහනේ කොටු තුළ ලියා දක්වන්න.




(i) නිමාලිට උතුරින් සනුති සහ දකුණින් වජිරා සිටියි.
(ii) නිමාලිගේ වම් අත පැත්තෙන් ගයනි සිටියි.
(iii) චමරිට වයඹ දෙසින් නිමාලි සිටියි.
(iv) ගයනිට උතුරින් සහ සනුතිගේ වම් අත පැත්තෙන් කසුනි සිටියි.
(v) දර්ශනීට බස්නාහිරින් නිමාලි සිටියි.
(vi) පවනි සිටින්නේ නිමාලිට නිරිත දෙසිනි.
(vii) දර්ශනීට උතුරින් මනුදි සිටියි. (ලකුණු 1 × 7)

(*b*) (i) කසුනිට ගිනිකොණ දෙසින් සහ චමරිට වයඹ දෙසින් සිටින්නේ කවු ද?
(ii) පවනිට ඊසාන දිශාවෙන් සිටින ළමුන් දෙදෙනා නම් කරන්න.
(iii) වජිරාට නැගෙනහිරින් සිටින ළමයා නම් කරන්න. (ලකුණු 1 × 3)

5\. (*a*) (i) රූපසටහනේ ඉංග්‍රීසි අක්ෂරවලින් දක්වා ඇති කෝණ වර්ග නම් කරන්න.




*a* -
*b* -
*c* -
*d* -
*e* -

(ලකුණු 5)

(ii) ඔරලෝසු මුහුණතක පැය කටුව සහ මිනිත්තු කටුව අතර කෝණය සරල කෝණයක් ලෙස පිහිටන අවස්ථාවක් ඇඳ එම වේලාව ලියා දක්වන්න. (ලකුණු 2)

(*b*) පහත සඳහන් සංඛ්‍යා ආසන්න දහයේ ගුණාකාරයට වටයන්න.
(i) 78 ............................
(ii) 135 ............................
(iii) 704 ............................

6. (*a*) සතියක් තුළ දසුනි පාඩම් කිරීමට ගත කළ කාලය පැය 55 කි. එය දින සහ පැයවලින් දක්වන්න. (ලකුණු 2)

(*b*) සුළු කරන්න.

(i)

| | මිනිත්තු | තත්පර |
|---|---|---|
| | 2 | 45 |
| + | 23 | 24 |

(ii)

| | දින | පැය |
|---|---|---|
| | 1 | 16 |
| + | 4 | 22 |

(iii)

| | පැය | මිනිත්තු |
|---|---|---|
| | 5 | 04 |
| − | 1 | 23 |

(iv)

| | දින | පැය |
|---|---|---|
| | 5 | |
| − | 3 | 15 |

(ලකුණු 1 × 4)

(*c*) මහනුවරින් පෙ.ව. 9.45 ට අනුරාධපුර හරහා යාපනය බලා ගමන් ආරම්භ කළ බස් රථයක් ගමනාන්තයට ලඟා වන විට ප.ව. 4.00 පමණ විය. පැය 1.30 ක් නවතා තිබූ බස් රථය නැවත මහනුවර බලා ගමන් ආරම්භ කළ අතර පැය 4 මිනිත්තු 10 කින් අනුරාධපුරයට ලඟා විය.

(i) මහනුවර සිට යාපනය බලා ගමන් කිරීමට බස් රථයට කොපමණ කාලයක් ගතවුණි ද? (ලකුණු 2)

(ii) යාපනයෙන් මහනුවර බලා පිටත් වූ වේලාව සොයන්න. (ලකුණු 1)

(iii) බස්රථය අනුරාධපුරයට ලඟාවන විට වේලාව සොයන්න. (ලකුණු 1)

***

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION · pesuru Prakashana Private Ltd. · Akura Pilot · සමනල දැනුම · T · සුහද

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

## සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**